# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/RDS/106/7/4

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2011.06.14

ජාතික අයවැය චක්‍රලේඛ අංක 152

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

<u>හදිසි ආපදා තත්ත්වයකදී ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන මාර්ගෝපදේශ</u>

හදිසි ආපදා තත්වයකදී විවිධ අමාත්‍යාංශ විසින් ආපදාවන්ට ලක්වූ දිස්ත්‍රික්කයන්හි සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් සමඟ ද්විකරණය වීම තුලින් අදාළ රාජ්‍ය ආයතන මුහුණ දෙන ගැටළු සහගත තත්වයන් ඉවත් කොට එම කටයුතු විධිමත් කිරීම සඳහා වන 2011.05.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආපදා අවස්ථාවලදී සහන පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම හා අදාලව එවකට පැවති නැවත පදිංචි කිරීමේ සහ ආපදා සහන සේවා අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2007/10 අංක දරණ 2007.10.01 දිනැති චක්‍රලේඛය හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2011/1 අංක දරණ 2011.02.08 දිනැති චක්‍රලේඛය ඇතුළු මේ හා අදාළ සියළුම චක්‍රලේඛ මෙයින් අවලංගු කරන අතර මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන 2011.05.11 දින සිට ඉදිරියට බලපැවැත්වේ.

03. ආපදාවකින් උද්ගතවන හදිසි තත්වයන් කළමනාකරණය කිරීමේ වගකීම අදාල අමාත්‍යාංශ අතරේ පහත පරිදි පැවරෙනු ඇත.

i. හදිසි ආපදා සහනාධාර සැපයීම - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
ii. කෙටි කාලීන හා සුළු පරිමාණ ආපදා පුනරුත්ථාපන කටයුතු - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
iii. ආපදාවකින් හානියට පත් යටිතල පහසුකම්වල මහා පරිමාණ ප්‍රතිසංස්කරණ කටයුතු - අදාල රේඛීය අමාත්‍යාංශ

04 **කඩිනම් ආපදා සහනාධාර සැපයීම**

හදිසි ආපදාවකදී විපතට පත් වූවන් සඳහා ඉතා ඉක්මණින් සහනාධාර සැපයීමට අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත වෙන්කරනු ලබන අතර විපතට පත් ප්‍රදේශයේ දිසාපති /දිස්ත්‍රික් ලේකම් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව එම ප්‍රතිපාදන ඔවුන් වෙත ආපදා කළමනාකරණ

අමාත්‍යාංශය මඟින් මුදාහරිනු ලැබේ. ආපදා අවස්ථාවලදී ප්‍රතිපාදන ලබා ගැනීම, සහනාධාර ලබා දීම හා සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටිය හා ඉදිරිපත් කල යුතු ලියකියවිලි පිළිබඳව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සුදුසු උපදෙස් දෙනු ඇත.

ආපදා සහනාධාර වල ස්වභාවය, සුළු හා විස්තීරණ ආපදා තත්වයන්ට පදනම්ව අවස්ථානුකූලව තීරණය කෙරෙනු ඇත. ඒ ඒ ආපදා අවස්ථාවන්හිදී ගෙවිය හැකි උපරිම සහනාධාර ප්‍රමාණයන් මෙහි ඇමුණුම 01 හි සඳහන් පරිදි විය යුතුය.

05. කෙටි කාලීන හා සුළු පරිමාණ පුනරුත්ථාපන කටයුතු

5.01 හදිසි ආපදා තත්වයකින් විපතට පත් ජනතාව යළි නගාසිටුවීම සඳහා පහත දැක්වෙන කෙටි කාලීන හා සුළු පරිමාණ පුනරුත්ථාපන කටයුතු සිදු කිරීමට අදාලව අවශ්‍ය ප්‍රතිපාදන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත වෙන් කර දෙනු ලබන අතර මේ සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල හානි ඇස්තමේන්තු කොට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමෙන් අනතුරුව විපතට පත් ප්‍රදේශයේ දිසාපති/දිස්ත්‍රික් ලේකම් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව එම ප්‍රතිපාදන ඔවුන් වෙත මුදා හැරිය යුතුය. ඒ ඒ ආපදා අවස්ථාවන්හිදී ගෙවනු ලබන සහනාධාර ප්‍රමාණයන් ඇමුණුම 01 හි සඳහන් පරිදි විය යුතුය.

- ස්වයං රැකියා ව්‍යාපාර යථාවත් කිරීම
- වගා සහනාධාර
- නිවාස පුනරුත්ථාපන කටයුතු
- හානියට පත් සුළු පරිමාණයේ ග්‍රාමීය මාර්ග, කුඩා වැව්, අමුණු, පාලම් වැනි ග්‍රාමීය යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම

5.02 ස්වයං රැකියා ව්‍යාපාර යථාවත් කිරීම සඳහා සහනාධාර ලබා දීමට අදාළව කටයුතු කිරීමේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් එම ජීවනෝපායන්ට අදාල කෘෂිකර්ම, ධීවර, පශු සම්පත් වැනි රේඛීය අමාත්‍යාංශ සමඟ මෙන්ම පළාත් සභා සමඟද සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත එම කාර්ය සඳහා මෙම චක්‍රලේඛ ඇමුණුමෙහි 4(viii) සඳහන් පරිදි ප්‍රතිපාදන මුදා හැරිය යුතු අතර ප්‍රතිලාභී කණ්ඩායම් හඳුනාගැනීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශය මත සිදුවිය යුතුය.

5.03 විස්තීරණ ආපදා තත්වයක් හේතුවෙන් වගාවකට හානි සිදුවූ අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් වගාවෙහි ස්වභාවය, වගාවෙන් ලබාගැනීමට අපේක්ෂිතව තිබූ අස්වැන්නෙහි වටිනාකම හා ඉඩමේ ප්‍රමාණය ආදී කරුණු සලකා බැලීමෙන් පසුව නිර්දේශිත ප්‍රතිලාභීන් සඳහා මෙම චක්‍රලේඛ ඇමුණුමෙහි 4(vii) සඳහන් පරිදි සහනාධාරය ගෙවිය යුතු අතර ඒ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන මුදා හැරිය යුතුය.

5.04 නිවාස සහනාධාරය සඳහා මෙම චක්‍රලේඛ ඇමුණුමෙහි 4(ix) සඳහන් පරිදි අවශ්‍ය ප්‍රතිපාදන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත වෙන් කර දෙනු ලබන අතර නිවාස සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා සම්බන්ධීකරණය වෙමින් දිස්ත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙන් එම කටයුත්ත සිදුකළ යුතුය. යෝජිත උපරිම සීමාව තුල ගෙවිය යුතු ප්‍රමාණය ඒ ඒ ඉල්ලුම්කරුහට විශේෂිත වන පරිදි හා නිවසෙහි හිමිකම හා ස්වභාවය මත පදනම්ව අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් නිර්දේශ කළ යුතුය.

06. මහා පරිමාණයේ ප්‍රතිසංස්කරණ කටයුතු

හදිසි ආපදා තත්වයකදී දිවයිනේ විවිධ දිස්ත්‍රික්කවල හානියට පත්වන මහා පරිමාණ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ වගකීම අදාල රේඛීය අමාත්‍යාංශයන්ට පැවරේ. මේ සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමට යන වියදම ඇස්තමේන්තු කොට පවත්නා ප්‍රතිපාදන තුලින් හෝ අවශ්‍ය වේ නම් භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමෙන් අනතුරුව එම කටයුතු අදාල රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කල යුතුය.

07. මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන හදිසි ආපදා අවස්ථාවකදී, ආපදාවේ තත්වය මත පදනම්ව අදාල සුදුසු උපදෙස් මහ භාණ්ඩාගාරය විසින් නිතුත් කරනු ඇති අතර මෙම චක්‍රලේඛයේ යම්කිසි පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් (දුරකථන අංක - 2484665) විමසිය යුතුය.

පී.බී.ජයසුන්දර
ලේකම්
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

පිටපත්
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

ඇමුණුම 01

ආපදා සහනාධාරවල ස්වභාවය සුළු හා ව්‍යසනකාරී/විස්තිරණ ආපදා තත්වයන්ට පදනම්ව අවස්ථානුකූලව තීරණය කෙරෙනු ඇත.

1. විස්තිරණ ආපදා

ගංවතුර, නියං, සුළි සුළං, නායයාම්, සුනාමි, භූමිකම්පා, වැනි ස්වාභාවික සිදුවීමක් නිසා පුළුල් ප්‍රදේශයක ජන ජීවිතය හා සමාජ හා ආර්ථික ක්‍රියාවලිය බිඳ වැටී, මිනිස් ජීවිත වලට, දේපල වලට, ජීවනෝපාය මාර්ගයන්ට හා යටිතල පහසුකම්වලට දැඩි ලෙස හානි සිදුව ඇති විස්තිරණ ආපදා තත්වයක දී ලබාදිය යුතු සහනාධාර වර්ග පහත පරිදි වේ.

පිසූ ආහාර, වියළි සලාක, අවමංගල්‍ය වියදම් පියවා ගැනීමේ ආධාර, වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට සහනාධාර, මූළුතැන්ගෙයි උපකරණ, වෘත්තිය මෙවලම්, වගා සහනාධාර, නිවාස සහනාධාර, කුඩා පරිමාණ ස්වයං රුකියා සහනාධාර

2. සුළු ආපදා

අකුණු සැර, පුපුරන ද්‍රව්‍ය, වන සතුන්, ගෙන් සමාජයේ සුළු පිරිසකට සිදුවන ජීවිත හානි හෝ සුළු දේපල හානි/වගා හානි සඳහා පහත දැක්වෙන සහනාධාර වර්ග සැපයෙනු ඇත.

අවමංගල්‍ය වියදම් පියවා ගැනීමේ ආධාර, වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට සහනාධාර, මුළුතැන්ගෙයි උපකරණ, වෘත්තිය මෙවලම්, වගා සහනාධාර, නිවාස සහනාධාර, කුඩා පරිමාණ ස්වයං රුකියා සහනාධාර.

3. ආපදා සහනාධාර ලැබීමට තිබිය යුතු සුදුසුකම්

3.1 පිසූ ආහාර සැපයීම

විස්තිරණ ආපදා තත්වයකදී තමාගේ නිවෙස්වලින් බැහැරව තාවකාලික සුභසාධන මධ්‍යස්ථානවල රැඳී සිටින සියලුම විපතට පත්වූවන් සඳහා පිසූ ආහාර සැපයිය යුතු අතර එහිදී ඔවුන්ගේ ආදායම් සීමාව, වයස, ස්ථිර පදිංචිය වැනි සීමාවන් නොසැලකිය යුතුය.

3.2 වියළි සලාක

වියළි සලාක ලබා දීමේ අවස්ථාවක් එළඹි වහාම අවශ්‍යතාවය අනුව වියළි සලාක ලබා දීම ආරම්භ කල යුතුය. ආපදා තත්වය යටතේ සුභසාධන මධ්‍යස්ථානවලට නොපැමිණ තම නිවසේ හෝ ඥාතීන්ගේ නිවෙස්වල සිටින පවුල් සඳහා සහ එම ආපදාවට ලක් වී තාවකාලික සුභසාධන මධ්‍යස්ථානවල සිටින පවුල් සඳහා පිසූ ආහාර දෙන කාල පරාසයට සමාන කාල පරාසයකට වියළි සලාක ලබා දිය යුතුය.

3.3 අවමංගල්‍ය කටයුතු සහනාධාරය

අවමංගල්‍ය කටයුතු සඳහා වන සහනාධාරය ආපදාව නිසා මියගිය අයගේ කලත්‍රයා හෝ ආසන්නම ඥාතියාට ලබා දිය යුතු අතර ඔහු / ඇය විසින් සිය ඥාති සම්බන්ධය තහවුරු කල යුතුය. මිය ගිය අයගේ මරණ සහතිකය හා අවමංගල්‍ය සඳහා දැරූ වියදම් පිළිබඳ ප්‍රකාශයක් ලබා ගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය.

### 3.4 ආපදාවකින් තුවාල ලබන පුද්ගලයින්ගේ වියදම්

ආපදාවකින් තුවාල ලබන පුද්ගලයින්ගේ වියදම් ගෙවිය යුතු ප්‍රමාණය තීරණය කිරීම සඳහා වෛද්‍ය වාර්තා හා නිර්දේශ පදනම් කර ගත යුතුය. මෙම ගෙවීම් නිර්දේශ කිරීමේදී ප්‍රාදේශීය ලේකම් විසින් නිසි පරිදි වෛද්‍ය සහතික, ප්‍රතිකාර කරන ලද ලියවිලි, බිල්පත් යනාදිය පරීක්ෂා කර බලා ඒ පිළිබඳව සෑහීමකට පත් විය යුතුය. රජයේ රෝහලකින් ප්‍රතිකාර ගන්නා අවස්ථාවලදී මෙම සහනාධාරය ගෙවිය යුතු නොවේ.

### 3.5 නියං සහනාධාර

නියං සහනාධාර ලබාදෙනුයේ නොකඩවා කන්න දෙකක් නියගය නිසා ගොවිතැන් පාළුවීම හෝ වගාකල නොහැකිවීම මතය. නියං සහනාධාර වශයෙන් ලබාදෙන ආධාර ප්‍රමාණය ඒ ඒ අවස්ථාවන්හිදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් දැනුම් දෙනු ලැබේ. එසේ විශේෂයෙන් නියං සහනාධාර හඳුන්වාදී නොමැති අවස්ථාවල චක්‍රලේඛ ඇමුණුමෙහි 4(ii) පරිදි වියළි සලාක ලබාදීමට කටයුතු කළ යුතුය.

### 3.6 මුහුදේ අතුරුදන් වූවන්

මුහුදේදී අතුරුදන් වූ ධීවරයින් සම්බන්ධ විස්තර ප්‍රාදේශීය ලේකම් විසින් ධීවර විෂය අයත් වන අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශය ද සහිතව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත යැවිය යුතු අතර එම ධීවරයන්ගෙන් යැපෙන්නන් සඳහා මාස 03 ක් දක්වා මෙම චක්‍රලේඛ ඇමුණුමෙහි 4.(ii) පරිදි වියළි සලාක ලබා දිය හැකි අතර ඒ සඳහා ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත මුදා හැරිය යුතුය. ඒ අතරතුර කාලයේදී ධීවරයින් නැවත පැමිණීම හෝ පවුලේ යැපෙන්නන් සඳහා ආදායම් මාර්ගයක් සැලසී තිබීම යන කරුණු සලකා වියළි සලාක ලබා දීම නතර කල යුතුය.

### 3.7 වගා සහනාධාරය

වගා සහනාධාරය, වගාවෙහි ස්වභාවය හා වගාවෙන් ලබාගැනීමට අපේක්ෂිතව තිබූ අස්වැන්නෙහි වටිනාකම සලකා බැලීමෙන් පසු උපරිමය අක්කර 1 ක් සඳහා ගෙවිය හැකි අතර එයට අඩු ඉඩම් සඳහා ඉඩමේ ප්‍රමාණය අනුව අනුපාතිකව සහනාධාරය ගෙවිය යුතුය.

### 3.8 ස්වයං රැකියා ආධාර

අඩු ආදායම්ලාභී පුද්ගලයෙකුගේ කුඩා පරිමාණ ස්වයං රැකියා ව්‍යාපාරයක් ආපදාව හේතුවෙන් සම්පූර්ණයෙන් විනාශ වූ විටෙක හා ඔහුගේ ආදායම් මාර්ගය සම්පූර්ණයෙන් ඇණහිට තිබෙන අවස්ථාවක හෝ ඔහුට වෙනත් කිසිදු ප්‍රභවයකින් ආදායම් මාර්ගයක් නොලැබෙන විටෙක ඔහුගේ විනාශ වූ ස්වයං රැකියා ව්‍යාපාරය වෙනුවෙන් සහනාධාර ලබාදිය හැක. එම කාර්ය සඳහා මෙම චක්‍රලේඛ ඇමුණුමෙහි 4(viii) සඳහන් පරිදි ප්‍රතිපාදන ලබාදිය යුතු අතර ප්‍රතිලාභී කණ්ඩායම් හඳුනා ගැනීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශය මත සිදුවිය යුතුය.

### 3.9 නිවාස සහනාධාර

නිවාස සහනාධාරය ගෙවනු ලබන්නේ ආපදාව හේතුවෙන් විනාශ වූ එක් පදිංචි නිවසක් අළුත්වැඩියා කරගැනීමට හෝ නැවත ඉදිකර ගැනීමටය. ඉල්ලුම්කරුට පදිංචිවීමට වෙනත් නිවසක් ඇති විට හෝ ව්‍යාපාරික ස්ථානවලට හෝ පොදු ගොඩනැගිලි සඳහා හෝ මේ යටතේ සහනාධාර සපයනු නොලැබේ. ඉල්ලුම්කරුගේ පවුලේ මාසික ආදායම රුපියල් 3,000 හෝ ඊට වඩා අඩුවන අවස්ථාවලදී පමණක් මෙම සහනාධාරය ලබාදිය යුතුය. නිවාස සහනාධාරය ලබාදීමේදී තාවකාලික හා ස්ථිර නිවාස යනාදි වශයෙන් ගැටළු පවතින අවස්ථාවල යෝජිත උපරිම සීමාව තුල ගෙවිය යුතු ප්‍රමාණය ඒ ඒ ඉල්ලුම්කරුහට විශේෂිත වන පරිදි හා නිවසෙහි ස්වභාවය හා නිවසෙහි නීත්‍යානුකූල හිමිකම මත පදනම්ව මෙම චක්‍රලේඛ ඇමුණුමෙහි 4(ix) සඳහන් පරිදි සහනාධාර ලබාදිය යුතු අතර ප්‍රතිලාභී කණ්ඩායම හඳුනා ගැනීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශය මත සිදුවිය යුතුය. ආපදා අවදානම සහිත ප්‍රදේශවල තිබූ නිවාස නැවත ඉදිකිරීමට මෙම සහනාධාරය නොගෙවිය යුතුය

04. සහනාධාර ගෙවිය යුතු ප්‍රමාණය

| ආපදා සහන වර්ගය | අංකය | සහනාධාර වර්ග | ගෙවිය යුතු ප්‍රමාණය රුපියල් | අදාල අමාත්‍යාංශය |
|---|---|---|---|---|
| කඩිනම් ආපදා සහන | i. | පිසූ ආහාර<br>i. දිමනාව එක් පුද්ගලයකුට දිනකට<br>ii.කාලය හා අනුමැතිය | රු. 150.00<br>දින තුනක් දක්වා ප්‍රාදේශිය ලේකම්ට, එතැන් සිට ඉදිරියට දින හතරක් දිසාපති / දිස්ත්‍රික් ලේකම්ට අනුමැතිය ලබාදිය හැක. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය දිස්ත්‍රික් ලේකම් මාර්ගයෙන් මෙය ක්‍රියාත්මක කළ යුතුය. |
| | ii. | <u>වියලි සළාක (සතියකට උපරිමය)</u><br>තනි පුද්ගලයකු සඳහා | 385.00 | |
| | | සාමාජිකයින් 02 යුත් පවුලකට | 490.00 | |
| | | සාමාජිකයින් 03 යුත් පවුලකට | 595.00 | |
| | | සාමාජිකයින් 04 යුත් පවුලකට | 700.00 | |
| | | සාමාජිකයින් 05 යුත් පවුලකට | 805.00 | |
| | | කාලය හා අනුමැතිය | දින හතක් දක්වා ප්‍රාදේශිය ලේකම්ට, එතැන් සිට ඉදිරියට දින හතක් දක්වා දිසාපති /දිස්ත්‍රික් ලේකම්ට අනුමැතිය ලබාදිය හැක. මුහුදේ අතුරුදන් වුවන් සම්බන්ධයෙන් වන සහනාධාර සැපයීමේ කාලය හා අනුමැතිය සඳහා මෙම ඇමුණුමෙහි 3.6 පරිදි ක්‍රියා කළ යුතුය. | |
| | iii. | මුලුතැන්ගෙයි උපකරණ ආධාර | 1,500.00 | |
| | iv. | වෘත්තිය මෙවලම් ආධාර | 3,000.00 | |
| | v. | අවමංගල්‍ය කටයුතු (එක් පුද්ගලයකුට) | 15,000.00 | |
| | vi. | ආපදාවකින් තුවාල ලබන පුද්ගලයින්ගේ වියදම් | (උපරිම සීමාව) 10,000.00 | |
| ආපදා පුනරුත්ථාපන සහන | vii. | වගා සහනාධාර | (උපරිම සීමාව) 25,000.00 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය දිස්ත්‍රික් ලේකම් මාර්ගයෙන් මෙය ක්‍රියාත්මක කළ යුතුය. |
| | viii | ස්වයං රැකියා ව්‍යාපාර ආධාර | 25,000.00 | |
| | ix | නිවාස පුනරුත්ථාපන ආධාර<br>සම්පූර්ණයෙන් හානි වූ නිවසක් සඳහා | (උපරිම සීමාව) 100,000.00 | |
| | | අර්ධ වශයෙන් හානි වූ නිවසක් සඳහා | (උපරිම සීමාව) 50,000.00 | |
| ආපදා යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය | x | අදාල යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය | පවත්නා ප්‍රතිපාදන හෝ අතිරේක ප්‍රතිපාදන | අදාල රේඛීය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කළ යුතුය |